දුරකථන / தொலைபேசி / Telephones: 011-2136600, 011-2136650
ලේකම් / செயலாளர் / Secretary: 011-2136602
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2876169, 011-2876181
විද්‍යුත් තැපැල / மின் - அஞ்சல் / E-mail: info@psc.gov.lk
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.psc.gov.lk

# රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය
**அரசாங்க சேவை ஆணைக்குழு அலுவலகம்**
## OFFICE OF THE PUBLIC SERVICE COMMISSION

අංක 1200/9, රජමල්වත්ත පාර, බත්තරමුල්ල
இல. 1200/9, இராஜமல்வத்தை வீதி, பத்தரமுல்லை
**No. 1200/9, Rajamalwatta Road, Battaramulla**


මගේ අංකය / எனது இல. / My No.: PSC/PRO/HB/26/2023
ඔබේ අංකය / உமது இல. / Your No.:
දිනය / திகதி / Date: 2024.06.11

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
සියළුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>දීප ව්‍යාප්ත සේවාවන්වල සේවා ව්‍යවස්ථා සංග්‍රහයන්හි විධිවිධාන අනුව පශ්චාත් උපාධි අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම</u>**

දීප ව්‍යාප්ත සේවාවන්වල සේවා ව්‍යවස්ථා සංග්‍රහයන්හි සඳහන් විධිවිධාන අනුව අදාළ උසස්කිරීම් සඳහා පශ්චාත් උපාධි අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීමේ දී අනුගමනය කළයුතු විධිවිධාන සම්බන්ධයෙන් නිකුත් කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 04/2018 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. තමුත් එම චක්‍රලේඛයෙහි 02 ඡේදයෙහි සඳහන් විධි විධාන අනුගමනය නොකරන අවස්ථාවන් පවතින බව රාජ්‍ය සේවා කොමිෂන් සභාව නිරීක්ෂණය කර ඇත.

03. සේවා ව්‍යවස්ථාවන්හි පැහැදිලිව සඳහන් විෂය පථයන්ගෙන් පරිබාහිර විෂය ධාරාවක් යටතේ පශ්චාත් උපාධියක් හැදෑරීමට යම් නිලධරයෙක් අපේක්ෂා කරන්නේ නම් හා එම පශ්චාත් උපාධිය, සේවා ව්‍යවස්ථාවේ අවශ්‍යතාව ප්‍රකාරව 1 ශ්‍රේණියේ හා විශේෂ ශ්‍රේණියේ උසස්වීම් හා අදාල කර ගැනීමට බලාපොරොත්තු වන්නේ නම් එම දේශීය හෝ විදේශීය පශ්චාත් උපාධිය හැදෑරීමට පෙර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ පූර්ව අනුමැතිය ලබා ගැනීමට කටයුතු කළයුතු ඛවට අවධාරණය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කර ඇත.

04. තවද එක් එක් සේවාවන් සඳහා අදාල පශ්චාත් උපාධිය සම්බන්ධව විශේෂඥ දැනුමක් සහිත කමිටු ස්ථාපනය කර එම කමිටු මගින් අදාල පශ්චාත් උපාධි සම්බන්ධව වන නිර්දේශ කොමිෂන් සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

05. එහිදී කමිටුව විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීමේ දී අනුගමනය කලයුතු මාර්ගෝපදේශ ඇමුණුම (1) ලෙස දක්වා ඇත.

06. ඒ අනුව ඉහත විධිවිධාන සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ 04/2018 හි විධිවිධාන තරයේ අනුගමනය කරන ලෙස අදාල සියළුම නිලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව දැනුම් දෙමි.

Mday

ඩබ්ලිව්.එච්.එම්.එම්.සී.කේ.දයාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ANNEX - 01

## General Guide to Determine the Relevancy of Postgraduate Degrees for Promotions and Passing Efficiency Bars in the Public Service

1. The relevancy of a postgraduate degree must be determined primarily in reference to the competencies required for the job role of the post.
2. In a question of definition of the specified subject/field of a postgraduate degree, there is possibility of defining a subject/field either broadly or narrowly.
3. In case of generalist services, it is appropriate to adopt the broadest possible definition of a subject to include all specializations/subfields of the subject/field.
4. In case of specialized services, it is more appropriate to adopt the narrow definition of the subject/field only to encompass the relevant particular specialty.
5. In determining whether the subject matter of a postgraduate degree comes within the scope of a particular subject, the committee may consult the definition of the scope of subjects given by;
    i. internationally recognized Learned Societies (e.g., International Union for Pure and Applied Chemistry (IUPAC), International Union for Pure and Applied Physics (IUPAP) etc.), and
    ii. internationally recognized academic journal indexing services (e.g., JEL classification of American Economic Association)